# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 684/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 21/04/2024<br>පැය 1555 |

**මාධ්‍ය නිවේදනය**

**01. කොකේන් මත් ද්‍රව්‍ය සමඟ සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශ ගුවන් තොටුපල ඒකකය.**

2024.04.20 වන දින උදෑසන කාලයේ කටුනායක ගුවන් තොටුපල රේගු මත් ද්‍රව්‍ය පාලන අංශය විසින් ස්කෑන් තාක්ෂණය ඔස්සේ ගුවන් මගීන් පරීක්ෂා කිරීමේදී සියෙරා ලියොන් සිට මෙරටට පැමිණි විදේශීය කාන්තාවන් දෙදෙනකු සම්බන්ධයෙන් ඇති වූ සැකය මත මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් සමඟ එක්ව වැඩිදුරටත් පරීක්ෂා කිරීමේදී කොකේන් මත්ද්‍රව්‍ය ගුලි 40ක් භාරයට ගෙන පොලිස් මත් ද්‍රව්‍ය කාර්යාංශ ගුවන් තොටුපල ඒකකය වෙත භාර දීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරියන් වයස අවුරුදු 40 සහ 42 යන වයස් වල පසුවන ගිනියා ජාතිකයින්වේ.**

මෙහිදි මෙම සැකකාරියන් කොකේන් මත් ද්‍රව්‍ය ගුලි ගිල දමා තිබියදී රේගු නිලධාරීන් හා මත් ද්‍රව්‍ය කාර්යාංශ නිලධාරීන් විසින් සැකකාරියන්ට ශරීර කෘත්‍යය සිදු කිරීමට සැලැස්වීමෙන් පසු එක් සැකකාරියකගේ උදරයේ ගුලි 29ක්ද අනෙක් සැකකාරියගේ උදරයේ ගුලි 11ක්ද තිබී හමු වී ඇත. සැකකාරියන් මීගමුව රෝහලට ඇතුලත් කර ඇති අතර පොලිස් මත් ද්‍රව්‍ය කාර්යාංශ ගුවන් තොටුපල ඒකකය මගින් වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ල බයි

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**